ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක: PS/DSP/03/16

2016 මැයි මස 04 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානින්
සියළුම රාජ්‍ය සමාගම්වල සභාපතිවරුන්

## ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2016 ජුනි 05

1972 වර්ෂයේ ස්ටොක්හෝම් නුවර පැවති ජාත්‍යන්තර පරිසර සමුළුවේදී ගන්නා ලද තීරණයකට අනුව බිහිවූ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) සමාරම්භක දිනය සැමරීම උදෙසා සෑම වසරකම ජුනි 05 වන දින "ජගත් පරිසර දිනය" වශයෙන් නම් කරන ලදී. ඒ අනුව පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමේ හා විවිධ පරිසර ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරවීමේ අරමුණින් සෑම වසරකම ජුනි මස 05 වන දින "ජගත් පරිසර දිනය" සමරනු ලබයි.

02. ලෝකයේ දැනට වෙසෙන බිලියන 07ක ජනගහනය ඉදිරියේදී තවත් වේගයෙන් වර්ධනය වනු ඇත. ඒ අනුව, ඔවුන්ගේ අවශ්‍යතා ද දිනෙන් දින වැඩි වනු ඇත. මේ නිසා සිදුවන විශාල සංවර්ධන ව්‍යාපෘති, අවිධිමත් පරිභෝජනය සහ නීති විරෝධී වනසත්ත්ව හා ශාක ජාවාරම් මෙන්ම, ගිනි තැබීම් හා ලැව්ගිනි හේතුවෙන්ද ලෝකයේ පවතින වනගහනය හා වනසත්ත්වගහනය ඉතා වේගයෙන් අඩුවෙමින් පවතී. ඇතැම් ජීවී විශේෂ වඳවීමේ තර්ජනයට ද ලක් වී ඇත. වනාන්තර විනාශය, වායු ගෝලයේ කාබන් ඩයොක්සයිඩ් ඇතුළු හරිතාගාර වායු අධිකවීම ආදී කරුණු හේතු කොටගෙන ගෝලීය උණුසුම ඉහළ යාම නිසා අද වන විට ලෝකය දේශගුණික විපර්යාසවලට මුහුණ දෙමින් සිටී. මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු නොකළහොත් මිනිසා ඇතුළු සමස්ත සත්ත්ව සංහතියම නුදුරු අනාගතයේදී ගැටළු රැසකට මුහුණ දෙනු ඇත. එබැවින් වනසම්පත හා වනජීවීන් සුරැකීමත්, වන ව්‍යාප්තිය වැඩිකිරීමත්, ජෛව විවිධත්වය ආරක්ෂාකරගනිමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මගින් මෙම ගැටළුවලට යම්තාක්දුරට විසඳුම් ලබාදිය හැකිය. මේ පිළිබඳව ලෝකවාසී ජනතාවගේ දැඩි අවධානය යොමු කිරීම පිණිස "වනජීවී සම්පත් නීතිවිරෝධී ලෙස අලෙවි කිරීමට එරෙහි වෙමු" (FIGHT AGAINST THE ILLEGAL TRADE IN WILDLIFE) යන තේමාව යටතේ 2016 වසරේ ජගත් පරිසර දිනය ලොව පුරා සමරනු ලබයි.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

03. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, ශ්‍රී ලංකාව තුළ ජගත් පරිසර දිනය සැමරීම සඳහා සෑම වසරකම ජුනි මස 05 වන දින යොදා ගැනීමටත්, මැයි 30 සිට ජුනි 05 දක්වා පූර්ව සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත්කිරීමටත්, ජාතික පරිසර සතිය තුළ සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල දායකත්වයෙන් විශේෂ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

04. ඒ අනුව 2016 මැයි මස 30 වන දින සිට ජුනි මස 05 වන දින දක්වා ක්‍රියාත්මක පරිසර සතිය තුළ පහත සඳහන් පරිදි වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

i. සියළුම රාජ්‍ය ආයතනවල ආයතන ප්‍රධානීන් විසින් ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, කාර්යාල පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, කාර්යාල පරිශ්‍ර තුළ කසළ වර්ගීකරණය කර (ප්ලාස්ටික්/පොලිතීන්/ කඩදාසි/ වීදුරු/ ලෝහ/ කාබනික ද්‍රව්‍ය ආදී ලෙස) බැහැර කිරීම ආරම්භ කිරීම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ii. පාසල්වල විදුහල්පතිවරුන් විසින් ලෝක පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම හා පාසල් සිසුන්ගේ සහභාගිත්වයෙන් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

iii. පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

iv. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය ප්‍රවර්ධනය කිරීම .

v. නීල හරිත ලස්සන ලංකා වැඩසටහන යටතේ පරිසර හිතකාමී "හරිත ගම්මාන" සහ "හරිත නගර" වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vi. ප්‍රජා සහභාගිත්වයෙන් පරිසර සංවේදී භූමි සංරක්ෂණ, රුක් රෝපණ වැඩසටහන් ඇතුළු විවිධ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

vii. හානියටපත් භූමි පුනරුත්ථාපනය කිරීම .

viii. පරිසර සංරක්ෂණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ix. පාරිසරික ප්‍රදර්ශන පැවැත්වීම.

x. හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xi. හරිත වෙරළ සංකල්පය ක්‍රියාවට නංවමින් වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම.

xii. තෙත් බිම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම.

xiii. වසවිස නැති කාබනික ගොවිතැන ප්‍රවර්ධනය කිරීම.

5. ඉහත වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා පූර්ව සැලසුම් සකස් කර අදාළ පාර්ශවයන් දැනුවත් කරන ලෙසත්, දේශපාලන නායකත්වයේ මහපෙන්වීම සහ සහභාගීත්වයෙන් යුතුව එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසත් දන්වමි.

6. අදාළ සතිය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්වල ප්‍රගතිය පරිසර සංරක්ෂණ ජනාධිපති කාර්යසාධන මෙහෙයුම වෙත වර්තා කරන මෙන්ද, ඉදිරි වර්ෂවලදී "ජාතික පරිසර සතිය" ක්‍රියාත්මක කිරීම තම ආයතනවල හා දිස්ත්‍රික්කවල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගන්නා මෙන්ද කාරුණිකව දන්වමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහි කිරීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කරමි.

**පි.බී.අබේකෝන්**
ජනාධිපති ලේකම්

**පිටපත්:**

01. අග්‍රාමාත්‍ය ලේකම් - කා.දැ.ගැ.ස
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - කා.දැ.ගැ.ස